තොරතුරු මාසිකය

2023 දෙසැම්බර්
ජනතා විමුක්ති පෙරමුණේ
අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි.

# විමර්ශන

ලෝකය වෙනස් කිරීමට වෙනස් වෙමු!

# 2024 අයවැය වියදම්

**2024 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකාවේ අයවැය ද පසුගිය දශක ගණනාවක් තුළ ඉදිරිපත් කරන ලද අයවැය මෙන්ම කිසිදු දැක්මක් හෝ ආර්ථික සංවර්ධන ඉලක්කයක් නොමැතිව හුදෙක් මැතිවරණ ඉලක්ක කරගෙන නිර්මාණය කරන ලද්දක් බව පැහැදිලි වේ. ජනතාව නැවතත් රැවටීමේ උත්සාහයක් මෙවර අයවැයෙන් ද දරා ඇති අතර අත්‍යවශ්‍ය අංශ නොසලකා ගොස් ඇත. ඒ අතර, අධ්‍යාපනය සහ සෞඛ්‍යය ප්‍රධාන වේ. අයවැය කතාවේ කළ සමහර කොටස් ඉදිරිපත් කළ අයවැය සමඟ පරස්පරතාවන් දක්වයි.**




"රජයේ ආදායම් වැඩි කරගන්නේ නැතුවත් ඕනෑ නම්, පඩි වැඩි කරන්න පුළුවන්. ඒ කොහොම ද? එක්කෝ සල්ලි අච්චු ගහන්න ඕනෑ. නැත්නම්, පිටරටකින් ණය ගන්න ඕනෑ. ඒත් නැත්නම්, අලුතෙන් බදු ගහන්න ඕනෑ. ඒ පිළිවෙත සමජීවිකතා සංකල්පයට විරුද්ධයි. එවැනි පියවරවලින් වෙන්නේ රට නැවතත් අගාධයට වැටීමයි" යනුවෙන් අයවැය කතාවේ දී සඳහන් කළ ද ණය ගැනීම සහ බදු ගැසීම හැර වෙනත් විකල්පයක් අයවැය තුළින් දක්නට නොලැබේ.

මෙවර අයවැයෙන් රජය ආදායම් ලබාගන්නා ආකාරය පහත අංක 01 වගුවෙහි දැක්වේ.

මෙම සටහනට අනුව රජය සුපුරුදු පරිදි ජනතාව මත බදු බර පටවා ආදායම් ලබා ගැනීමේ පැරණි ක්‍රමවේදයම අනුගමනය කර ඇති අතර, එතුළ ද වක්‍ර බදු ප්‍රතිශතය විශාල ලෙස ඉහළ නංවා තිබේ. මෙම ඉහළ නැංවීමට අනුකූලව වැට් බදු 18%ක් දක්වා ඉහළ දැමීමට නියමිතය. එහි ඍජු ප්‍රතිඵලයක් ලෙස ආර්ථිකයේ භාණ්ඩ හා සේවා මිල ඉතා විශාල ලෙස ඉහළ යා හැකිය. මෙම වක්‍ර බදුවල ඉහළ යාම පසුගිය වසර දෙක තුළ 155%ක් පමණ වේ. ජනතාවට ජීවන බර දරා ගැනීමට නොහැකි තැනට පත්වී තිබෙන්නේ මෙලෙස විශාල ලෙස බදු ඉහළ යාමයි. මෙම වැඩිවීමට සාපේක්ෂව ජනතාවගේ ආදායම් ඉහළ නොගිය අතර, සිදුවූයේ ආර්ථිකය කඩාවැටීම සහ ආදායම් අහිමිවීමයි. අංක 02 වගුවෙන් එය පැහැදිලි වේ.

ඉහත වගුවට අනුව 2024 වර්ෂයේ ද විශාල අයවැය හිඟයක් පවතින අතර, එය පසුගිය වසරට වඩා 18.00%ක වැඩිවීමකි. මෙම අයවැය හිඟය පියවා ගැනීම සඳහා පසුගිය වසරවලදී මෙන්ම ආණ්ඩුවට ණය ගැනීමට සිදුවන අතර 'අයි.එම්.එෆ්.' (IMF) උපදෙස්වලට අනුව අයවැය හිඟය අඩු කර ගැනීමට නොහැකිවී තිබේ. එලෙසම පසුගිය වසරට වඩා 22.00%කින් වියදම ඉහළ ගොස් ඇති අතර, එම වියදම් තුළද පසුගිය වසරවලදී මෙන්

**මෙවර අයවැයෙන් රජය ආදායම් ලබාගන්නා ආකාරය (රුපියල් බිලියන) - වගු අංක 01**

| විස්තරය | 2022 | 2023 | 2024 | 2023 ට සාපේක්ෂව වැඩිවීම% | 2022 ට සාපේක්ෂව වැඩිවීම% |
|---|---|---|---|---|---|
| මුළු ආදායම සහ ප්‍රධාන | 2,013 | 2,851 | 4,127 | 44.75 | 105.0 |
| මුළු ආදායම | 1,979 | 2,839 | 4,107 | | |
| 1 බදු ආදායම | 1,751 | 2,596 | 3,820 | 47.14 | 118.16 |
| ආදායම් බදු | 534 | 864 | 1,080 | | |
| භාණ්ඩ හා සේවා මත බදු | 876 | 1,376 | 2,235 | 62.42 | 155.13 |
| අභ්‍යන්තර වෙළෙඳාම මත බදු | 341 | 357 | 505 | | |
| 2 බදු නොවන ආදායම | 228 | 243 | 287 | | |
| ප්‍රධාන | 33 | 12 | 20 | | |

**2024 අයවැය හිගය (වගු අංක 02)**

| විස්තරය | 2022 රුපියල් බිලියන | 2023 රුපියල් බිලියන | 2024 රුපියල් බිලියන | 2023 ට සාපේක්ෂව වැඩිවීම |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම | 3,520 | 4,471 | 5,277 | |
| ණය පොලී | 1,565 | 2,193 | 2,651 | 20.88% |
| ප්‍රාග්ධන වියදම | 953 | 782 | 1,701 | |
| මුළු වියදම | 4,473 | 5,253 | 6,978 | 32.83% |
| මුළු ආදායම සහ ප්‍රධාන | 2,013 | 2,851 | 4,127 | |
| අයවැය හිගය | 2,460 | 2,402 | 2,851 | 18.69% |
| හිගය පියවීමට දේශීය ණය ගැනීම් | 425 | 340 | 726 | |
| හිගය පියවීමට විදේශීය ණය ගැනීම් | 2,035 | 2,062 | 2,125 | |

**2024 අයවැය හිගය (වගු අංක 03)**

| විස්තරය | 2023 රුපියල් මිලියන | 2024 රුපියල් මිලියන |
|---|---|---|
| ජනාධිපති සහ කාර්ය මණ්ඩලය | 3,781 | 6,601 |
| අගමැති සහ කාර්ය මණ්ඩලය | 1,011 | 1,155 |
| පාර්ලිමේන්තුව | 3,815 | 4,339 |
| මැතිවරණ කොමිසම | 10,989 | 11,044 |
| මුදල් අමාත්‍යාංශය | 613,936 | 224,949 |
| ආරක්ෂක අමාත්‍යාංශය | 410,000 | 423,725 |
| සෞඛ්‍ය අමාත්‍යාංශය | 322,000 | 410,289 |
| අධ්‍යාපන අමාත්‍යාංශය | 232,000 | 237,050 |
| කර්මාන්ත අමාත්‍යාංශය | 8,208 | 9,108 |

අත්‍යවශ්‍ය නොවන වියදම් ඉහළ ගොස් තිබේ.

ඉහත වගුවට අනුව ණය ගැනීම ගැන බුදු බණ කීව ද, අවසානයේ සිදු කර ඇත්තේ ණය ගැනීම පමණි.

ඒ අතරම ප්‍රධාන අයවැය ශීර්ෂ කිහිපයක් පහත අංක 03 වගුවෙහි දක්වා ඇත.

ඉහත වියදම් ලේඛනය අනුව ජනාධිපති, අගමැති සහ පාර්ලිමේන්තුව වෙනුවෙන් 2024 වර්ෂය සඳහා රුපියල් මිලියන 12,905ක් වෙන් කර ඇති අතර, දිනක වියදම රුපියල් මිලියන 33.1ක් හෙවත් කෝටි 3.31කි. ශ්‍රී ලංකාව වැනි බංකොලොත් රාජ්‍යයක මෙම ජනතා බදු මුදල් ආයෝජනය කෙතරම් ප්‍රතිඵල අත්කරදී ඇත් ද යන්න ප්‍රශ්න කළ යුතුව ඇත.

ආර්ථික අර්බුදයක් ඇති අවස්ථාවක රජය බදු ආදායම ඉහළ නංවා ගැනීමට උත්සාහ දරා ඇත්තේ, වක්‍ර බදුවලින් වන අතර, එය භාණ්ඩ හා සේවා මත බදු (VAT) ලෙස සහ ජාත්‍යන්තර වෙළෙඳාම මත පනවන බදු ලෙස කොටස් දෙකකට වෙන් කර ගත්විට මෙහි අර්බුදය තවත් පැහැදිලි වේ. ලංකාවේ ආර්ථිකය මුළුමනින්ම පාහේ ආනයන මත රඳාපවතින නිසා සහ අත්‍යවශ්‍ය ආහාර, බෙහෙත් ඇතුළු බොහෝ භාණ්ඩ වර්ග ආනයනය කරන නිසාත් ආර්ථිකයේ මිල මට්ටම් ලබන වසරේ විශාල ලෙස ඉහළ යා හැක්කේ මෙම ජාත්‍යන්තර වෙළෙඳාම මත විශාල බදු ප්‍රමාණයක් පටවා ඇති නිසා ය. එය පහත අංක 04 වගුවෙන් පැහැදිලි කළ හැකි ය.

**ජාත්‍යන්තර වෙළඳාම මත බදු - රුපියල් මිලියන (වගු අංක 04)**

| විස්තරය | 2022 | 2023 | 2024 | පසුගිය වසරට වඩා වෙනස % |
|---|---|---|---|---|
| ආනයන බදු | 50,009 | 88,000 | 175,000 | 98% |
| ආනයන බදු | 41 | 28 | 35 | 25% |
| ආනයන අපනයන බලපත්‍ර ගාස්තු | 3,086 | 2,900 | 2,900 | - |
| වරාය සහ ගුවන්තොටුපොළ සංවර්ධන ගාස්තු | 180,595 | 166,000 | 175,000 | 5% |
| විශේෂ භාණ්ඩ බදු | 40,193 | 50,000 | 95,000 | 90% |

ඉහත වගුවට අනුව ආනයන මත බදු දෙගුණයක් බවට පත්වී ඇති අතර, ඒ අනුව ආර්ථිකයේ බඩු මිල විශාල ලෙස ඉහළ යා හැකි වන්නේ මෙයට 18%ක භාණ්ඩ හා සේවා බද්දත් එකතු වන නිසා ය.

අයවැය හිගය පියවා ගැනීමේ දී එය දේශීයව සහ විදේශීයව ණය මඟින් පියවා ගැනීමට සිදු වේ. එය පහත අංක 05 වගුව මඟින් පැහැදිලි කළ හැකි ය.

**අයවැය හිගය පියවීම - රුපියල් බිලියන (වගු අංක 05)**

| විස්තරය | 2022 | 2023 | 2024 |
|---|---|---|---|
| **දේශීය** | **5,269** | **16,259** | **7,248** |
| දේශීය අරමුදල් | 2,227 | 2,995 | 3,234 |
| විදේශ අරමුදල් සම්බන්ධ පිරිවැය | 16 | 41 | 48 |
| විශේෂ නීති | 3,026 | 13,222 | 3,965 |
| **විදේශීය** | **716** | **619** | **578** |
| විදේශීය ණය | 683 | 581 | 517 |
| විදේශීය ප්‍රධාන | 33 | 38 | 61 |
| **මුළු අයවැය හිගය පියවීම අවශ්‍යතාව** | **5,895** | **16,879** | **7,826** |

ඉහත අංක 05 වගුවට අනුව 2024 වසරේ මුළු අයවැය හිගය පියවීමේ අවශ්‍යතාව රුපියල් බිලියන 7,826කි. ඒ අනුව රට තව දුරටත් ණය උගුලේ හිර වීම හැර වෙනත් සාධනීය තැනකට තල්ලු වන බවක් දක්නට නැත.

2024 වසරේ ණය සේවාකරණ ගෙවීම්, එනම් ණය වාරික සහ පොලී ගෙවීම සඳහා ද පහත සඳහන් මූල්‍ය අවශ්‍යතාවන් සපුරා ගැනීමට සිදු වේ. ඒ අනුව ණය වාරික ගෙවීම සඳහා රුපියල් බිලියන 4,268ක් සහ ණය පොලී ගෙවීම සඳහා රුපියල් බිලියන 2,651ක මුදලක් අවශ්‍ය වේ. ඒ අනුව ණය වාරික සහ පොලී ගෙවීම වෙනුවෙන් 2024 සඳහා රුපියල් බිලියන 6,919ක මුදලක් අවශ්‍ය වන බව මෙවර අයවැය තුළින් පැහැදිලි වේ. මේ සියල්ල කැටි කර ගත්විට ලබන වසරේ දීත් ණය ගැනීම සහ බඩු මිල ඉහළ යාම අනිවාර්ය කරුණක් ලෙස පවතී.

# පුල්මුඩේ ඛනිජවැලි නිධිය විකිණීමේ අවසන් අදියර

**ශ්‍රී ලංකාවේ ඛනිජවැලි සම්පත ගැන විමසීමේ දී ලොව ඉතා දුර්ලභ, වැඩි වටිනාකමකින් යුත් ඛනිජවැලි වර්ග ගණනාවකම භූමියක් බවට අප රට පත්ව තිබේ. වාර්ෂිකව ඉල්මනයිට් ටොන් 90,000ක්, රූටයිල් ටොන් 9,000ක්, සර්කෝන් ටොන් 5,500ක්, මොනසයිට් ටොන් 100ක් ලෙසින් නිස්සාරණය කරනු ලබයි. ශ්‍රී ලංකාවේ ඊසානදිග, නැගෙනහිර, ගිනිකොණ, නිරිතදිග සහ වයඹ පළාත් ආශ්‍රිත වෙරළේ සහ අභ්‍යන්තරයේ මෙම ඛනිජ සම්පත් පිහිටා තිබේ.**



පුල්මුඩේ සහ නිලාවැලි ප්‍රදේශවල ඉල්මනයිට්, පුල්මුඩේ රූටයිල්, බලංගොඩ, මීරිගම සහ පුල්මුඩේ යන ප්‍රදේශවල සර්කෝන් ආදී වශයෙන් පැතිර තිබේ. විශේෂයෙන් මින් ප්‍රධානතම නිධිය වන පුල්මුඩේ වෙරළ ආශ්‍රිතව ඉල්මනයිට්, රූටයිල් සහ මොනසයිට් සංඝටක අඩංගු මුහුදු වැලි අතිවිශාල වටිනාකමක් ගෙනදේ. එම මුහුදු වැලිවලින් සියයට 70ක් ඛනිජවැලි වීම එහි ඇති ඉහළ වටිනාකමයි. එවැනි සංයුතියක් සහිත ඛනිජවැලි ලොව ඉතා දුර්ලභ වේ.

1957දී කර්මාන්ත සමාගම් පනත යටතේ ලංකා ඛනිජවැලි සංස්ථාව ස්ථාපනය කර තිබේ. එහි අරමුණ වී ඇත්තේ, ඛනිජවැලි කැණීම, සැකැසුම්කරණය සහ අපනයනය සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමයි. එය 1962දී රජය සතු සමාගමක් ලෙස ස්ථාපනය කර තිබේ. 1992දී එම සමාගම 'ලංකා මිනරල් සෑන්ඩ් ලිමිටඩ්' ලෙස නම් කිරීම සිදු කෙරිණි. 1962දී ඉහත සමාගම ඇරඹීමත් සමඟ විදේශ ආධාර මත පුල්මුඩේ ඛනිජ නිධිය පදනම් කරගෙන කර්මාන්ත ශාලාවක් ආරම්භ කෙරිණි. එමඟින් මුහුදු වැලිවලින් ඛනිජවැලි වෙන් කිරීම සිදුකිරීම ආරම්භ විය. 1962දී එසේ වෙන් කර ගත් ඉල්මනයිට්, රූටයිල්, සර්කෝන් ආදී ඛනිජවැලි ප්‍රථම තොගය ජපානයට අපනයනය කෙරිණි. එවක පටන් අද දක්වාම එලෙසින්ම ලොව වෙළෙඳපොළේ අඩුම මිල ගණන් යටතේ ලොව හොඳම ඛනිජවැලි එමඟින් අපනයනය කෙරේ. එහිදී ඉල්මනයිට්වල සහ රූටයිල්වල මිල තීරණය කරනුයේ, එහි ඇති ටයිටේනියම් ඔක්සයිඩ් ප්‍රමාණය මතයි. නමුත්, අප ඛනිජවැලි අපනයනය කරනුයේ, අඩුම ටයිටේනියම් ඔක්සයිඩ් ප්‍රමාණයක් ඇති ඉල්මනයිට් ලෙසයි. ඉහත සංඝටක වෙන් කිරීමේ උපකරණ අලුත්වැඩියාව මඟින් හෝ නවීන උපකරණ යොදා ගැනීමෙන් හෝ ටයිටේනියම් ඔක්සයිඩ් ප්‍රතිශතය සියයට 2 සිට 4 දක්වා වැඩි කළ හැකි බව විද්‍යාඥයන්ගේ මතයයි.

නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාවට නඟමින් සිටින ධනපති ආණ්ඩු වරින්වර රජය සතු, රටට අයිති මෙම සම්පත මුළුමනින්ම විකුණා දැමීමට සැලැසුම් කරමින් සිටී. ඛනිජවැලි සංස්ථාව සමාගමක් කළේම එම අරමුණ සහිතවය. එහෙත්, භූ විද්‍යාඥයන්, ජ.වි.පෙ. ඇතුළු පිරිස්වල මැදිහත්වීමෙන් ගත් විරෝධතා සහ නෛතික ක්‍රියාමාර්ග හේතුවෙන් එය ඇදී ඇදී යන්නක් විය. වර්තමාන ආයෝජන ප්‍රවර්ධන ඇමැතිවරයා ලෙස ජනපති රනිල් වික්‍රමසිංහ වසර දෙකක් තුළ ඩොලර් මිලියන 50ක ආයෝජන ගෙන ඒමේ මුවාවෙන් මෙම ඛනිජ නිධි මුළුමනින්ම විකුණා දැමීමට සූදානම් වේ. එහිදී ඔවුන් අපනයන ඉලක්කය ලෙස ගනුයේ, ඛනිජවැලි නිධියෙන් සියයට 30ක් වසර දෙකකදී අපනයනය කිරීමයි.


ඒ මුවාවෙන් සමස්ත ඛනිජ නිධි විකුණා දැමීමේ සැලැසුම් සකස් කරනුයේ, ඉතාමත් කුප්‍රකට, ප්‍රෝඩාකාරී අයුරිනි. මන්නාරම් ප්‍රදේශයේ ඛනිජ නිධි පිළිබඳව ගවේෂණය කර ඇති 'ටයිටේනියම් සෑන්ඩ්ස්' (Titanium Sands) නම් ඕස්ට්‍රේලියානු සමාගමක් එම ප්‍රදේශයේ පවතින ඛනිජවැලි ප්‍රමාණයට වඩා පස්ගුණයක් එහි ඇති බවට සාවද්‍ය වාර්තාවක් ලබාදී ඇත. තිරියාය - කල්අරාව ප්‍රදේශයේ කැණීම් කළ 'මිඩ් හෙවි සෑන්ඩ්' (Mid Heavy Sand) සමාගම නියමිත ගැඹුර මෙන් තුන්ගුණයක් ගැඹුරට ගවේෂණය සිදුකර භූවිද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය සිදු කර සොයාගත් ගවේෂණාත්මක දත්තවලට වඩා දත්ත ලෙසින් පස්ගුණයක් ඛනිජවැලි ඇති බවට වාර්තා ඉදිරිපත් කර ඇත්තේ, කලින් මීටර 4.2ක ගැඹුරට කරන ලද කැණීම් මීටර 10ක් දක්වා ඔවුන් විසින් සිදුකරනු ලැබ පෙන්වා දෙන අතිවිශාල ඛනිජවැලි නිධියෙන් පහෙන් එකක් පමණක් ලබා දීම ලෙසිනි. එනම්, දැනට තිබෙන සමස්ත ඛනිජ නිධියම විකුණා දැමීමයි.

# මානව පරිණාමය පිළිබඳ නූතන

**පසුගිය කලාපය හා සම්බන්ධයි**

## හෝමෝ රුඩොල්ෆෙන්සිස් (Homo Rudolfensis)

අදින් වසර මිලියන 1.8කට පමණ පෙර මිහිමතින් වඳව යන්නට ඇතැයි විශ්වාස කෙරෙන හෝමෝ රුඩොල්ෆෙන්සිස් නම් මානව විශේෂය බිහිවන්නට ඇත්තේ අදින් වසර මිලියන 2.4කට පමණ පෙර වන්නට ඇතැයි විද්‍යාඥයෝ විශ්වාස කරති. කෙන්යාවේ ටුර්කානා ජලාශය ආශ්‍රිතව මෙම විශේෂයට අයත් පොසිල ප්‍රථම වරට සොයාගත් බැවින්ද, මෙම ජලාශය 'රුඩොල්ෆ් ජලාශය' ලෙස පෙරදී හඳුන්වා ඇති බැවින්ද මෙම විශේෂයට රුඩොල්ෆෙන්සිස් යන නාමය තබා ඇත. එසේ ප්‍රථම වරට සොයාගන්නා ලද්දේ 1972දී කෙන්යානු ජාතික විද්‍යාඥයකු වූ රිචර්ඩ් ලීකි විසිනි.





**හෝමෝ හැබිලිස් හා හෝමෝ රුඩොල්ෆෙන්සිස් හිස් කබල් දෙකක් අතර වෙනස**

මුල්කාලයේදී රුඩොල්ෆෙන්සිස් අයත් වන්නේ හෝමෝ හැබිලිස් විශේෂයට යැයි විද්‍යාඥයන් විශ්වාස කළද, දත්වල ස්වභාවය අනුව රුඩොල්ෆෙන්සිස් අයත් වන්නේ ඔස්ත්‍රලෝපිතකස් විශේෂයට යැයි 1999දී විද්‍යාඥයෝ පිරිසක් අදහස් ඉදිරිපත් කළහ. 2003දී ඕස්ට්‍රේලියානු විද්‍යාඥ ඩේවිඩ් කැමරූන් සඳහන් කළේ රුඩොල්ෆෙන්සිස්ගේ දේහ විලාශය වඩාත් සමීප වන්නේ කෙන්යන්ත්‍රොපස් ප්ලැටියොපස්ට බවත්, එහෙයින් කෙන්යන්ත්‍රොපස් රුඩොල්ෆෙන්සිස් යනුවෙන් නම් කළ යුතු බවත්ය. කෙසේ නමුත්, 2008දී එතෙක් සොයාගෙන තිබූ පොසිල වඩාත් හොඳින් නැවත සැකැසීම සහ අධ්‍යයනය කිරීම සිදුව තිබූ අතර, එහිදී පැහැදිලිවූ ලක්ෂණ සමඟ හෝමෝ රුඩොල්ෆෙන්සිස් ලෙස අවසන් වතාවට නාමකරණය සිදුකර ඇත. එහෙත්, සමහර විද්‍යාඥයන් අදටත් පවසන්නේ හෝමෝ රුඩොල්ෆෙන්සිස් යනු පිරිමි හෝමෝ හැබිලිස් මානවයන් බවයි. එහෙත්, එකම විශේෂයේ පිරිමි - ගැහැනු අතර පෙනුමේ වෙනස්කම් පැවැතිය හැකි වුවද, මෙතරම් වෙනසක් පැවැතිය නොහැකි යැයිද තවත් විද්‍යාඥයෝ පිරිසක් තර්ක කරති.

රුඩොල්ෆෙන්සිස්ගේ මුහුණ හෝමෝ හැබිලිස් විශේෂයටත් වඩා පැතලි හැඩයක් ගනී. එසේම පළල් මුහුණක් ඔවුන් සතුව තිබී ඇත. එසේම හෝමෝ හැබිලිස්ගේ කපාල ධාරිතාව ඝන සෙන්ටිමීටර් 600ක් පමණ වුවද, හෝමෝ රුඩොල්ෆෙන්සිස්ගේ කපාල ධාරිතාව දළ වශයෙන් ඝන සෙන්ටිමීටර 700-750ක් පමණ වේ. එහෙත්, රුඩොල්ෆෙන්සිස් විශේෂය සතු චාර්වක දත් හෝමෝ හැබිලිස්ට සාපේක්ෂව පළලින් වැඩි සේම ඝන එනැමලයකින් යුතු වන්නේ ඔස්ත්‍රලෝපිතකස් විශේෂවල මෙනි.

හෝමෝ රුඩොල්ෆෙන්සිස් මානවයන් හෝමෝ හැබිලිස් විශේෂයට වඩා උසින් වැඩි අතර, ඔස්ත්‍රලෝපිතකස් විශේෂවලට වඩා මිටි විය. රුඩොල්ෆෙන්සිස් පිරිමි මානවයන් ගැහැනු අයට සාපේක්ෂව විශාල දේහයක් සහිත විය. මෙම විශේෂයට අයත් පොසිල ලෙස සොයාගෙන ඇති බහුතරයක් හිස්කබල්වල කොටස් නිසාත්, අනෙකුත් අස්ථි අවම වීම නිසාත් ඔවුන්ගේ ශරීර ස්වභාවය පිළිබඳව තවමත් නිවැරැදිම අදහසක් නොමැත. කෙසේ වුවද, පිරිමි රුඩොල්ෆෙන්සිස් මානවයකු අඩි 5යි අඟල් 3ක පමණ උසින් හා කි.ග්‍රෑ. 60ක පමණ බරින්



**හෝමෝ රුඩොල්ෆෙන්සිස් අනුරුවක්**

යුක්ත වන්නට ඇතැයි සැලැකෙන අතර, ගැහැනු අයකුගේ උස අඩි 4යි අඟල් 11ක් පමණද, බර කි.ග්‍රෑ. 50ක් පමණ ද වන්නට ඇතැයි විශ්වාස කෙරේ.

නැගෙනහිර අප්‍රිකානු භූමි ආශ්‍රිතව ජීවත්වී ඇති මෙම මානව විශේෂය බොහෝ සෙයින් පැළෑටි ආහාරයට ගන්නට ඇති බවටත්, සමහර අවස්ථාවලදී මාංශ වර්ගද ආහාරයට ගන්නට ඇති බවටත් විශ්වාස කෙරේ. මෙම විශේෂයට අයත් යැයි සැලැකෙන පොසිල සොයාගෙන ඇත්තේ කෙන්යාව, ඉතියෝපියාව සහ මලාවි යන රටවලින් පමණි. සමකාලීනව සිටි හෝමෝ හැබිලිස් ගල් ආයුධ නිපදවූ බවට සහ භාවිත කළ බවට සාක්ෂි තිබුණද, රුඩොල්ෆෙන්සිස් එසේ නිපදවූ බවට ප්‍රමාණවත් සාක්ෂි මෙතෙක් හමුවී නැත. දෙපයින් ගමන් කිරීමේ හැකියාව මොවුන්ට තිබුණද, දෙපයින් සිට පාද තබද්දී, නිවැරැදි ලෙස අපේක්ෂිත ස්ථානයටම පාද තැබීමේ හැකියාවක් මොවුන් සතුව නොතිබෙන්නට ඇති බව විද්‍යාඥයෝ විශ්වාස කරති.

සීත එහෙත් වියළි කාලගුණයක් රුඩොල්ෆෙන්සිස් වාසය කළ




එක්




පූර්ව

# ගවේෂණ

**05 වන කොටස**




එක් විශේෂ වෙන් වෙන් වශයෙන් මානව පරිණාමය ඉදිරියට පැමිණි ආකාරය පිළිබඳ දළ සටහනක්




මානව විශේෂ කිහිපයක හිස් කබල් සහ මුහුණේ ආකෘතිය පිළිබඳ දළ සංසන්දනයක්

ප්‍රදේශවල එවකට තිබෙන්නට ඇතැයි විද්‍යාඥයන් විශ්වාස කරන අතර, තණ බිම් ආශ්‍රිතව මෙන්ම ලඳු කැලෑ ආශ්‍රිතව ද ඔවුන් ජීවත් වන්නට ඇත. මොවුන් මිහිමත විසූ කාලයේදී අසල්වැසි භූමිවල ඔස්ත්‍රෙලෝපිතකස් අප්‍රිකානුස්, ඔස්ත්‍රෙලෝපිතකස් සෙඩීබා, පැරැන්ත්‍රොපස් බොයිසෙයි, පැරැන්ත්‍රොපස් රොබස්ටස්, හෝමෝ හැබිලිස්, හෝමෝ අර්ගාස්ටර්, හෝමෝ ඉරෙක්ටස් ආදී විශේෂ ජීවත්වී ඇත.

හෝමෝ රුඩොල්ෆෙන්සිස් පරිණාමය වූයේ කෙන්යන්ත්‍රොපස් ප්ලැටියොපස්ගෙන් යැයි සමහර විද්‍යාඥයන් විශ්වාස කරන අතර තවත් සමහරකු පවසන්නේ LD 350-1 පොසිලය සහිත මානව විශේෂය හරහා පරිණාමය වන්නට ඇති බවයි. හෝමෝ රුඩොල්ෆෙන්සිස් සම්පූර්ණයෙන් මිහිමතින් තුරන් වූවා ද, එසේත් නැතහොත් වෙනත් විශේෂවලට පරිණාමය වෙමින් ඉදිරියට ආවා ද යන්න තවමත් නිශ්චිතව පැවසිය නොහැකි ය.

### හෝමෝ ගෞටන්ජෙන්සිස් (Homo gautengensis)

හෝමෝ හැබිලිස් සහ හෝමෝ අර්ගාස්ටර් විශේෂවලට අයත් යැයි නම් කර තිබූ අප්‍රිකානු කලාපයෙන් සොයා ගන්නා ලද පොසිල කිහිපයක විශේෂ ලක්ෂණ අධ්‍යයනය කල ඩැරන් කර්නෝයි නම් විද්‍යාඥයා 2010දී ඒවා වෙනත් මානව විශේෂයකට අයත් බව සලකා එම විශේෂය හෝමෝ ගෞටන්ජෙන්සිස් ලෙස නම් කර ඇත. (ඔස්ත්‍රෙලෝපිතකස් අප්‍රිකානුස් ලෙස හා පැරැන්ත්‍රොපස් රොබස්ටස් ලෙස නම් කරන ලද පොසිල කිහිපයක් ද ඒ අතර ඇත.) කෙසේ නමුත්, එම නම් කිරීම අදටත් බොහෝ සෙයින් විවාදාත්මක වන අතර, සමහර විද්‍යාඥයන් පවසන්නේ එලෙස නව විශේෂයක් ලෙසින් නම් කිරීම සඳහා සලකා බැලිය හැකි විශේෂ කරුණු ඇත්තේ කිහිපයක් පමණක් බවයි. එම විවාදාත්මක අදහස් මත ගෞටන්ජෙන්සිස් වෙනත් මානව විශේෂයක් ලෙසට අදටත් පොදු පිළිගැනීමකට ලක්ව නැත.

හෝමෝ ගෞටන්ජෙන්සිස් නම් කිරීම සඳහා යොදාගත් පොසිල සාක්ෂි අදින් වසර ලක්ෂ 8ත් - ලක්ෂ 18ත් අතර කාලය පුරා පැතිර ඇත. එම නිසා සැබැවින්ම මෙය වෙනත් විශේෂයක් ලෙස පැවැතියේ නම්, වැඩිම කාලයක් පෘථිවිය මත වාසය කළ, පැරණිම මානව විශේෂය ගෞටන්ජෙන්සිස් වීමට බොහෝ සෙයින් ඉඩකඩ ඇත.

සොතෝ-ස්වානා භාෂාවෙන් 'දෙවියන්ගේ පෙදෙස' යන අරුත් දෙන දකුණු අප්‍රිකාවේ ගෞටන්ග් පළාතේ නමින් ගෞටන්ජෙන්සිස් නම් කර ඇත්තේ, බොහෝ පොසිල හමුව ඇත්තේ එම පළාතෙන් වීම හේතුවෙනි. මෙම විශේෂයට අයත් යැයි පවසනු ලබන පොසිල දකුණු අප්‍රිකාවේ ප්‍රදේශ කිහිපයකට සීමාවී ඇත. ඒවා නැගෙනහිර අප්‍රිකානු භූමි පදනම් කරගනිමින් (වැඩි වශයෙන්) සොයා ගන්නා ලද



**හෝමෝ ගෞටන්ජෙන්සිස් විශේෂයට අයත් යැයි නම් කරන ලද හිස් කබලක් (STW53)**

පෙන්වයි. හැබිලිස්ට වඩා සාපේක්ෂව පළල් දත් පිහිටීම ඉන් ප්‍රධාන ලක්ෂණයකි. එමෙන්ම STW 53 නම් පොසිලය හෝමෝ ගෞටන්ජෙන්සිස් විශේෂයේ පොසිලයක් ලෙස වර්ග කර ඇතත්, එය ඔස්ත්‍රෙලෝපිතකස් සෙඩීබාටත් වඩා සමකාලීන හෝමෝ මානවයන්ගෙන් වෙනස්

07 පිටුවට




# පලස්තීනය නැවතත් මහා මිනිස් සංහාරයක මුවවිට

**පසුගිය ඔක්තෝබර් 07වැනි දින පලස්තීනයේ හමාස් සංවිධානය විසින් ඊශ්‍රායලයේ නගර කිහිපයකට එල්ල කරන ලද ප්‍රහාරයට හා ප්‍රාණ ඇපකරුවන් අල්ලා ගනු ලැබීමට ආවරණය වෙමින්, ඊශ්‍රායලය පලස්තීනයේ ගාසා තීරයට ගුවනින් හා ගොඩබිමින් නොකඩවා පහර දෙමින් සිටී. මේ වන විට 14,800කට වැඩි පලස්තීනුවන් පිරිසක් මියගොස් ඇති අතර, ඒ අතුරින් 6,000ක් ළමයින්ය.**

පලස්තීනයේ නිවාස, සරණාගත කඳවුරු, රෝහල් ඇතුළු යටිතල පහසුකම් විශාල ප්‍රමාණයක් විනාශ වී ගොස් තිබේ. ඉන්ධන, ජලය හා විදුලිය තවදුරටත් නොලැබෙන දේය. ආහාර පවා දුර්ලභ දේය. සටන් විරාම සත් දින තුළ ආහාර හා අනෙකුත් මානුෂීය අවශ්‍යතා රැගත් ට්‍රක් රථ සිය ගණනක් ඊජිප්තු දේශ සීමාව ඔස්සේ ගාසා වෙතට ඇතුළු වීමට ඉඩ ලැබී තිබුණ ද, යුද්ධයට පෙර දිනකට ඇතුළුවූ ට්‍රක් රථ 500ක තොග සමඟ සැසැඳීමේදී එය මිලියන 2.2ක ජනතාවකට කිසිසේත් ප්‍රමාණවත් නොවේ. කෙසේ වුව ද, සටන් විරාමය අවසන් වීමත් සමඟ එම සැපයුම් සියල්ල ද ඇනහිට තිබේ.

හමාස්වරුන් දඩයම් කරන බව කියමින්, ඊශ්‍රායලය සිදු කරන යුද අපරාධවලට එරෙහිව ලොව පුරා රටවලින් විරෝධය මතු වෙමින් තිබේ. සරණාගත කඳවුරු, රෝහල් ලෙස නම් කරන ලද ස්ථාන පවා බෝම්බ ප්‍රහාරවල ඉලක්ක බවට පත්ව ඇත. හමාස් - ඊශ්‍රායල් යුද්ධයක් ලෙස ඇරැඹි නමුදු, මේ වන විට මෙම යුද්ධය පලස්තීන ජනතාවට එරෙහි ප්‍රහාරයක් බවට පත්වී ඇති බවට ලොව පුරා ඊශ්‍රායලයට චෝදනා එල්ල වෙමින් තිබේ. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කර්යාලය ප්‍රකාශ කර ඇත්තේ, ජබාලියා වැනි සරණාගත කඳවුරකට බෝම්බ හෙළීම යුද අපරාධ ගණයට ගැනෙන තත්ත්වයක් විය හැකි බවය. සත් දිනක සටන් විරාමයෙන් පසුව ඊශ්‍රායලය නැවතත් යුද්ධය ආරම්භ කර ඇත්තේ, එක් දිනක් තුළ බෝම්බ ප්‍රහාරවලින් පලස්තීනුවන් 178 දෙනකුට ජීවිත අහිමි කරමිනි.

පලස්තීනයට සිදුවන අමානුෂික ඊශ්‍රායල ප්‍රහාර සමඟ ලොව පුරා මිලියන සංඛ්‍යාත ජනතාව පලස්තීන ජනතාවට සහයෝගීතාව පළ කිරීමටත්, රෝහල්, සරණාගත කඳවුරු ඇතුළු සිවිල් ජනතාව ඉලක්ක කර ගත් ඊශ්‍රායල හමුදා



ප්‍රහාරවලට විරෝධය පළ කිරීමටත් උද්ඝෝෂණ සංවිධානය කරමින් සිටිති. මෙම ප්‍රහාරවලින් පසුව රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් ද ඊශ්‍රායලය තව තවත් හුදෙකලා වෙමින් පවතී. විශේෂයෙන්ම මෙතෙක් ඔවුන් සමඟ සබඳතා පැවැත්වූ චිලිය හා කොලොම්බියාව තමන්ගේ තානාපතිවරුන් ඊශ්‍රායලයෙන් ඉවත් කර ගැනීමට පියවර ගත්තේය. අර්ජන්ටිනාව ජබාලියා සරණාගත කඳවුරුවලට කළ ප්‍රහාර හෙළා දුටු අතර, බොලීවියාව ඊශ්‍රායලය සමඟ සියලු සබඳතා අත්හැර දැමීය. ටියුනීසියානු පාර්ලිමේන්තුව තවත් ඉදිරියට යමින් සියොන්වාදී ඊශ්‍රායලය පිළිගැනීම, ඔවුන් සමඟ සෘජුව හෝ වක්‍රව සබඳතා පැවැත්වීම රාජ්‍ය ද්‍රෝහී අපරාධ වරදක් බවට පත් කරන නීතියක් සම්මත කළේය. ස්පාඤ්ඤය ද ඊශ්‍රායලය සමඟ වූ තානාපති සබඳතා අත්හරින බව ප්‍රකාශ කළේය.

ගාසාහි ක්‍රියාත්මකවූ එකම පිළිකා රෝහල වසා දැමීමට සිදුව තිබූ අතර, ඛනිජ තෙල් තහනම හමුවේ විදුලි ජනක යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමට නොහැකි වීමෙන් සෙසු රෝහල් ද පවතින්නේ වසා දැමීමේ අද්දරය. ගාසාහි රෝහල් 36න් මේ වන විට අවම වශයෙන් කොටසක් හෝ ක්‍රියාත්මකව පවතින්නේ රෝහල් 18ක පමණි. නැවත බෝම්බ ප්‍රහාර ඇරැඹීමට පෙරම ගාසාහි බොහෝ රෝහල් පැවැතියේ බිහිසුණු සිනමා දර්ශන ලෙසය. දරුණු ලෙස ලේ ගලා යමින් සිටින සහ විලාප නඟමින් සිටින තුවාලකරුවන් එක දිගට කොරිඩෝවල දිගා කර සිටීම හා ප්‍රමාණවත් ප්‍රතිකාර නොමැතිව මිය යමින් සිටීම ලෝක සෞඛ්‍ය සංවිධානය නියෝජනය කරමින් පලස්තීනයේ සේවය කරන විදේශීය නිලධාරීන්ට සිහිගන්වන්නේ එබඳු තත්ත්වයකි.

ඊශ්‍රායලයේ අමානුෂික යුද්ධයට එරෙහිව මතුවූ ලෝක ජනමතය හමුවේ කටාරයේ මැදිහත් වීමෙන් පළමුව සිව් දිනක සටන් විරාමයක් ඇරැඹියේ නොවැම්බර් 24 දිනදීය. එම එකඟතාවට අනුව මානුෂීය සහන සැපයුම් රැගත් ට්‍රක් රථවලට ගාසා තීරයට ඇතුළු වීමට ඉඩ දීමටත්, සිරකරු හුවමාරු වැඩසටහනක් ආරම්භ කිරීමටත් තීරණය විය. ඒ අනුව සටන් විරාම කාලය තුළ ඊශ්‍රායලය පලස්තීන සිරකරුවන් 150ක් ද, හමාස් සටන්කාමීන් සිය භාරයේ සිටින ප්‍රාණ ඇපකරුවන් 50 දෙනකු ද හුවමාරු කර ගැනීමට යෝජනාවී තිබිණි. කෙසේ වුව ද, කිහිප වරක් සටන් විරාම කාලය දිගු වෙමින්, එය දින හතක කාලයක් ක්‍රියාත්මක විය. මේ කාලය 07 පිටුවට

## මානව පරිණාමය පිළිබඳ .......

04-05 - පිටුවෙන්

ලක්ෂණ සහිත වේ.දෙපයින් ගමන් කිරීමේ හැකියාව සහිත මෙම විශේෂය ආහාර ගැනීමේ දී, විලෝපිකයන්ගෙන් ආරක්ෂා වීමේ දී, නිදාගැනීමේදී ගස් මත ද සිටින්නට ඇතැයි මතයක් පවතී. එමෙන්ම අඩි 3 ඉක්මවූ උසක්, කිලෝ ග්‍රෑම් 50ක පමණ බරක් ඔවුනට තිබෙන්නට ඇත.

ප්‍රමාණවත් පොසිල සාක්ෂි නොතිබීමත්, මෙතෙක් හෝමෝ ගෞටන්ජෙන්සිස් නමින් නම් කර ඇති පොසිල හොඳින්ම ආරක්ෂා වී නොතිබීමත් නිසා මෙය වෙනත් විශේෂයක් ද යන්න අදටත් පැහැදිලිව කිව නොහැකි වුව ද, ඒ සම්බන්ධව විද්‍යාඥයෝ තවදුරටත් අධ්‍යයන සිදුකරමින් සිටිති. කෙසේ නමුත්, එය අවසන් වන තුරු හෝමෝ ගෞටන්ජෙන්සිස් මානව පරිණාමයේ ස්ථානයක් අත් කරගන්නේද, එසේ අත්කර ගන්නේ නම්, ඒ කුමන ස්ථානය ද යන්න පැවසිය නොහැකිය.

තවත් කොටසක් ඉදිරි කලාපයෙන් බලාපොරොත්තු වන්න

## පලස්තීනය .......

06 - පිටුවෙන්

තුළ හමාස් සංවිධානය විසින් ඊශ්‍රායල ජාතිකයන් 100 දෙනකුට වැඩි පිරිසක් නිදහස් කරන ලද අතර, ඊශ්‍රායලය විසින් පලස්තීනුවන් 240කට ආසන්න පිරිසක් නිදහස් කර තිබිණි. අවසාන සිරකරු හුවමාරුව එනම්, ඊශ්‍රායල ප්‍රාණ ඇපකරුවන් 8 දෙනකුට පලස්තීනුවන් 30 දෙනකු නිදහස් කිරීම සිදුව තිබුණේ නොවැම්බර් 30 වැනි දිනයේදීය. එකිනෙකාට එල්ල කර ගන්නා චෝදනා මැද සටන් විරාමය අවසන් වුව ද, තවත් ඊශ්‍රායල ප්‍රාණ ඇපකරුවන් 145 දෙනකු පමණ හමාස් භාරයේ සිටින බවට විශ්වාස කෙරේ.

සත් දින සටන් විරාමයෙන් අනතුරුව ඊශ්‍රායල හමුදා නැවතත් ගුවන් ප්‍රහාර සහ ගොඩබිම් මෙහෙයුම් අරඹමින් තිබූ අතර, එය තවත් මහා මානව සංහාරයක ඇරැඹුම විය හැකි හැකි බවට අදහස් පළ වේ. විශේෂයෙන් නිවෙස් අහිමිව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සරණාගත කඳවුරුවල ටෙන්ට් යට ජීවත්වන දහස් ගණනකට (දැනට මෙම පිරිස මිලියන 1.1කි) බෝම්බ ප්‍රහාරවලින් බේරීමට අමතරව එළැඹෙන ශීත සෘතුව හමුවේ දැඩි ශීතල සහ එයින් හටගන්නා රෝග තත්ත්වයන් හේතුවෙන් ජීවිතයත්, මරණයත් අතර සටනක යෙදෙන්නට සිදු වනු ඇති බවට බිය පළවේ. දැනටමත් පාචනය හා ශ්වසන රෝග පැතිර යමින් ඇති තත්ත්වයක් තුළ සහ පිළිකා ඇතුළු නිධන්ගත රෝග සඳහා ඖෂධ නොමැති වීම නිසා බෝම්බ ප්‍රහාරවලින් මියගිය සංඛ්‍යාවට වඩා වැඩි පිරිසක් මිය යනු ඇතැයි ලෝක සෞඛ්‍ය සංවිධානය අනතුරු අඟවයි.

අභ්‍යන්තරික දේශපාලන අර්බුදයක ගිලී සිටි බෙන්ජමින් නෙතන්යාහු අගමැතිවරයාට ඉන් ගොඩ යා හැකි මඟක් සේ පෙනෙන්නේ තාවකාලිකව හෝ තම ජනතාවගේ ගැලවුම්කරුවාගේ භූමිකාවට පණ පෙවීමය. හමාස් අතුගා දමන තුරු ඉදිරියට යන බවට වහසි බස් දොඩන්නේ එබැවිනි. ඒ වෙනුවෙන් පලස්තීන ජනතාවගේ ජීවිත කොපමණ ප්‍රමාණයක් විනාශ වුව ද කම් නැත. මේ තත්ත්වය තුළ එළැඹෙන වසරේ ඊශ්‍රායල මැතිවරණය පැවැත්වෙන තෙක් නෙතන්යාහු විසින් නඩත්තු කරනු ලැබීමට ඉඩ ඇති යුද්ධය වෙනුවෙන් පලස්තීන වැසියනට ගෙවන්නට සිදු වන 'ජීවිත මිල' අධික වනු ඇත.

## ආර්ථික ජාතිකවාදය .......

08 - පිටුවෙන්

### නව ලිබරල්වාදය (විවෘත ආර්ථිකය)

ඉහත තත්ත්වය තුළ ඒ වෙනුවෙන් මාර්ගය පාදා ගැනීම සඳහා මෙම සංකල්පය ඉදිරිපත් විය. අදහස මුලින්ම ඉදිරිපත් කරනු ලැබුයේ, 'ලෝක බැංකුවේ' සභාපතිවරයා ලෙස කලක් කටයුතු කළ රොබට් මැක්නමාරාය. ඉන්පසු එය රේගන්වාදය සහ තැචර්වාදය ලෙස ද හඳුන්වන ලදී. 'නිදහස් වෙළෙඳපොළ ආර්ථිකය හෙවත් විවෘත ආර්ථිකය' හඳුන්වා දුන්නේ ඒ අනුවය. මීට සමාන්තරව 'ගෝලීයකරණය' නම් සංකල්පය ද හඳුන්වා දෙන ලදී. 1991දී සමාජවාදී කඳවුර බිඳවැටීම හමුවේ නව ලිබරල්වාදයට විශේෂ වාසිසහගත තත්ත්වයක් ද ඇති විය.

මේ වන වන විට යළිත් වටයකින් ධනවාදය පදනමින්ම අර්බුදයටම ගමන්ගෙන තිබේ. අධිරාජ්‍යවාදයට තවදුරටත් නව ලිබරල්වාදය තුළ තම පැවැත්ම සහතික කර ගැනීමට නොහැකි තත්ත්වයක් උදා වී තිබේ.

### ලෝක ආර්ථිකයේ සිදුවන වෙනස්කම් සහ ආර්ථික ජාතිකවාදය

වත්මන් මොහොත වන විට ලෝක දේශපාලන-ආර්ථික ක්ෂේත්‍රය තුළ පැහැදිලි වෙනස්කම් මෙන්ම නව ප්‍රතිවිරෝධතා පද්ධතියක් ද නිර්මාණය වෙමින් තිබේ.

ස්වාධීන යුරෝපයක් ගොඩනැඟීමේ උත්සාහය මීන් ප්‍රධාන එකකි. 2022 වන විට ගෝලීය නාමික දළ දේශීය නිෂ්පාදිතයෙන් හයෙන් එකක් (ඩොලර් ට්‍රිලියන 16.6ක්) යුරෝපා සංගමයට අයත්ව තිබේ. මෙම ස්වාධීනත්වයක් ගොඩනඟා ගැනීමේ උත්සාහය වැඩිපුරම දක්නට ලැබෙන්නේ ආර්ථික ක්ෂේත්‍රය තුළය. 'අප්‍රිකානු සංගමයේ' ඉදිරි ගමන, 'බ්‍රික්ස්' (BRICS) සංවිධානය පුළුල්වීම (ලෝක දළ දේශීය නිෂ්පාදිතයේ එකතුවෙන් සියයට 30ක් 'බ්‍රික්' (BRIC) සන්ධානයේ රටවලට අයත්ය). 'ඕකුස්' (AUKUS), 'නේටෝ' (NATO), 'කොඩ්' (QUAD), 'ෂැංහයි කෝපරේෂන්' (Shanghai Cooperation) වැනි සංවිධානවල නව වර්ධනයන් හරහා මෙම නව වෙනස්කම් පෙන්නුම් කෙරෙමින් තිබේ. විනිමය හුවමාරුව සඳහා විකල්ප ක්‍රම භාවිත කරමින්, ඩොලරයෙන් ඉවත්වීමේ ක්‍රියාවලිය (De-dollarization) පෙරට පැමිණ තිබේ. **මේ තත්ත්වයන් තුළ ආර්ථික අර්බුදයට මුහුණ දීම සඳහා අධිරාජ්‍යවාදය විසින් තෝරාගෙන ඇති ක්‍රියාමාර්ගය වී තිබෙන්නේ ප්‍රාග්ධනය, ශ්‍රමය සහ භාණ්ඩ සංචලනය සඳහා තීරු බදු ඇතුළු සීමා කිරීම් ඇති කිරීමේ ප්‍රතිපත්තිය හරහා ආර්ථිකය තුළ රාජ්‍ය මැදිහත්වීමට ප්‍රමුඛත්වය දෙන ක්‍රමයකි. ඒ හරහා ඔවුන් බලාපොරොත්තු වන්නේ ආර්ථිකය ජාතිකවාදී ඉලක්කවලට මෙහෙයවීමයි. මෙම දෘෂ්ටිවාදය සහිත ක්‍රමය 'ආර්ථික ජාතිකවාදය' ලෙස හැඳින්වේ.** නමුත් මෙය ධනවාදයේ විශේෂ අවධියක් නොව අධිරාජ්‍යවාදයේම මතුපිටින් කරනු ලබන වෙනස්කම් ලෙස තේරුම්ගත යුතුය. ධනවාදය හා අධිරාජ්‍යවාදය පදනමින් වෙනස් නොකොට එහි පැවැත්ම වෙනුවෙන්ම සිදුකරනු ලබන මෙවැනි උපක්‍රමික පියවර මඟින් ඔඩුදුවා ඇති ආර්ථික අර්බුදයට විසඳුම් ලැබෙන්නේ නැත.

# ආර්ථික ජාතිකවාදය යනු කුමක් ද?

**ලෝක දේශපාලනය තුළ පැරැණි ප්‍රතිවිරෝධතා වෙනස් වෙමින්, නව ප්‍රතිවිරෝධතා ගණනාවක් මතුවෙමින් තිබේ. පොදුවේ ප්‍රකෘතිය තුළ පවතින සෑම ක්ෂේත්‍රයක්ම ඉදිරියට යන්නේ දයලෙක්තික සම්බන්ධතාවකට අනුව බව අපි දනිමු. ධනේශ්වර ආර්ථික රටාවට ද, ඒ මත ගොඩනැඟෙන ලෝක දේශපාලනයට ද මෙම පොදු නියාමය එකසේ බලපානු ලබයි.**

විශේෂයෙන් සමාජවාදී කඳවුරේ බිඳවැටීමෙන් පසු ලෝක දේශපාලනයේ ගමන්මඟ තුළ පැවැති ප්‍රතිවිරෝධතා වෙනස්වූ අතර, මේ වන විට ඒවා ද වෙනස් වෙමින් පවතී. නව දේශපාලන සහ ආර්ථික කඳවුරු ගොඩනැඟෙමින් පවතී. ගොඩනැඟෙන නව දේශපාලන හෝ ආර්ථික හෝ සංකල්ප ද හඳුනාගත යුත්තේ, වියුක්තව නොව මෙම තත්ත්වයට සාපේක්ෂව ය. විවිධ වකවානු තුළ විවිධ ආර්ථික සංකල්ප පෙරට ඒමේ ඉතිහාසයක් අපි දකිමු. 'ආර්ථික ජාතිකවාදය' නමින් සාකච්ඡාවට බඳුන්වී ඇති සංකල්පය ද තේරුම් ගැනීමේ දී මෙම විවිධ සංකල්ප ගොඩනැඟීමේ ඉතිහාසය ද විමසා බැලීම කළ යුත්තකි.



### ධනවාදයේ ගමන්මඟ තුළ ආර්ථිකය

යුරෝපා වැඩවසම් ක්‍රමය තුළ උපත ලබා වර්ධනයවූ ධනවාදය එතෙක් පැවැති පරිභෝජනය මූලික කර ගත් සරල හුවමාරු භාණ්ඩ නිෂ්පාදනය වෙනුවට අලෙවිය අරමුණු කොට ගත් වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදනය ආරම්භ කළ අතර, එහි මූලික පරමාර්ථය වූයේ ලාභ ලැබීමයි. හස්ත කර්මාන්ත වෙනුවට මහා පරිමාණ කර්මාන්තත්, ප්‍රාදේශීය වෙළෙඳපොළ වෙනුවට ජාත්‍යන්තර වෙළෙඳපොළකුත් ඒ අනුව නිර්මාණය කරන ලදී. මෙලෙස 16, 17, 18 වැනි සියවස්වල සිදුවූ ධනේශ්වර විප්ලව කිහිපයක් හරහා තහවුරුවූ ධනවාදය අරම්භක යුගයේ වර්ධනය වූයේ නිදහස් තරගය තුළ ය. රජය ආර්ථිකයට මැදිහත් නොවූ අතර, ලිබරල්වාදය ලෙස ද ප්‍රචලිත වූයේ මෙයයි. මෙහි ප්‍රතිඵලය වූයේ නිෂ්පාදනය වැඩිවී අධිනිෂ්පාදන අර්බුද ඇතිවීමයි. එය විසින් නිෂ්පාදන අරාජිකත්වයකට ද මඟපාදන ලදී.

මෙම තත්ත්වය පාදක කර ගනිමින්, ආරම්භයේදීම ධනවාදය බරපතළ ලෙස අර්බුදයට ගියේ ය.

මේ ආකාරයට නිදහස් තරගය තුළ අර්බුදයට ගිය ධනවාදය 19 වැනි සියවස අග දී සහ 20 වැනි සියවස ආරම්භයේ දී ධනවාදයේ ඒකාධිකාරී අවධිය හෙවත් අධිරාජ්‍යවාදයට පියවර තැබී ය. තනි තනි කර්මාන්ත හිමියන්, බැංකු හිමියන් අතර තිබූ තරගය වෙනස් වෙමින්, කාටල, සංගත, සම්මේල සහ සමාගම් හරහා ඒකාධිකාර බිහි කර ගැනුණු අතර, එය මෙම අර්බුදයට තාවකාලික විසැඳුමක් බවට පත් විය. මෙම තත්ත්වය විග්‍රහ කළ ලෙනින්, එය ධනවාදයේ ඉහළම අවධිය හෙවත් අධිරාජ්‍යවාදය ලෙසින් හඳුනා ගත්තේ ය. අධිරාජ්‍යවාදය බිහිවීමත් සමඟ ඒ තුළ ද නව ප්‍රතිවිරෝධතා මතු විය. ඒකාධිකාරී සමාගම් අතර තරගය ඇති විය. අන්තර් අධිරාජ්‍ය ප්‍රතිවිරෝධය ලෙස හඳුනා ගනු ලබන්නේ එයයි. මෙම තත්ත්වය ලෝක යුද්ධ දෙකකට මූලික හේතුව බවට පත් විය.

මෙම ලෝක යුද්ධ දෙක නිමවූයේ සමාජවාදී රුසියාවක් සහ සමාජවාදී කඳවුරක් නිර්මාණය කරමිනි. ඒ තත්ත්වය තුළ සමාජවාදී කඳවුරට මුහුණ දීම සඳහා යළිත් වෙනස්වීමට අධිරාජ්‍යවාදයට බල කෙරිණි.

### කේන්සියානු (රාජ්‍ය සුභසාධන) ධනවාදය

මෙම මතවාදයේ නිර්මාතෘවරයා වූයේ ජෝන් මේනාඩ් කේන්ස් (John Maynard Keynes) ය. 1936දී ඔහු විසින් රචිත 'ජෙනරල් තියරි' නම් ග්‍රන්ථයෙන් ධනවාදය පවත්වාගෙන යාම සඳහා ආර්ථිකයට රජය මැදිහත්විය යුතු අතර, එහිදී කර්මාන්ත හිමියන්ට මෙන්ම පාරිභෝගිකයන්ට ද සහන ලබා දිය යුතු විය. මෙම ක්‍රියාදාමය තුළ ද අධිරාජ්‍යවාදයට වැඩි කල් පැවැතීමට නොහැකි විය. එය යළිත් අර්බුදයට ගියේ ය. 1970 දශකය තුළ දැවැන්ත ආර්ථික අර්බුදයක් ඇතිවූ අතර, 1973 පමණ වන විට තත්ත්වය බරපතළ විය. තවදුරටත් රාජ්‍ය සුභසාධන ක්‍රමය තුළ පැවැතීමට අධිරාජ්‍යවාදයට නොහැකි විය. තමන්ට අභිමි හෝ සීමා පනවා ඇති හෝ රටවල වෙළෙඳපොළ සහ සම්පත් කොල්ලකෑමේ අවශ්‍යතාව මතු විය.

07 පිටුවට



"ධනේශ්වර සමාජයේ සබඳතාවන් විසින් නිපදවන ලද ධන සම්භාරය අඩංගු කර තැබීමට ප්‍රමාණවත් නොවන තරමින් එය පටු විය. ධනපති පංතිය මේ අර්බුදයන්ගෙන් ගොඩ එන්නේ කෙසේද? එක් අතකින් බල කිරීම නිසා නිෂ්පාදන බලවේගයන්ගේ ඉමහත් තොගයක් විනාශ කර දැමීමෙනි. අනෙක් අතින් අලුත් වෙළෙඳපොළවල් අල්ලා ගැනීමෙන් හා පැරැණි වෙළෙඳපොළවල් එහෙම පිටින්ම සූරාකෑමෙනි. එය කරන්නේ කෙසේද? වඩාත් විස්තීර්ණවූද, වඩාත් විනාශකාරීවූද අර්බුදවලට මඟ හෙළි කිරීමෙන් හා අර්බුද වළක්වාලන මාධ්‍යයන් අඩුකරලීමෙනි."

**(කොමියුනිස්ට් ප්‍රකාශනය - 41 පිටුව)**